8357

ISSN 1800 - 4067

# THE ROYAL ASIATIC SOCIETY OF SRI LANKA

## 9th Annual Research Conference
## 24th - 26th March 2016

# ABSTRACTS

Royal Asiatic Society of Sri Lanka
96, Ananda Coomaraswamy Mawatha
Colombo 07, Sri Lanka

# සිංහල ජන කවියෙන් හෙළි වන අපරාධ විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්

# A Study of Crimes as depicted in Sinhala Poems

රජිත් නාමසිංහ[1] නිශානි රණවීර[2]

සිංහල ගැමියාගේ අව්‍යාජත්වය සරල බව හා සංයමය පෙන්වන කැඩපත ජන කවිය යි. නිශ්චිත කතුවරයකු හෝ නිශ්චිත කාලවකවානුවක් හෝ නොමැති ජන කවිය දෛනික ජන ක්‍රියාකාරකම් මුල් කොට ගෙන බිහි වී තිබේ.

පණ්ඩිතමානී අලංකාරොක්තීන්ගෙන් බැහැර වීමත් සරල භාෂා ව්‍යවහාරයකින් සමන්විත වීමත් ජන කවියේ ඇති සුවිශේෂතා ලෙස සැලකිය හැකි ය. ඒවා බොහෝ විට යොදා ගත්තේ පාළුව කාන්සිය මඟ හරවා ගැනීමට යි. ජන කවිවල ස්වරූපය අනුව පාරු කවි, බඹර කවි, කරත්ත කවි, නෙලුම් කවි කුරක්කම් කවි ඈ වශයෙන් වර්ග කරේ.

අපරාධ නම් සමාජ සංසිද්ධිය මිනිසාගේ සම්භවය දක්වා ඈතට දිව යන්නෙකි. වර්තමානයේදී අපරාධ යන්න අපරාධ නීතිය උල්ලංඝණය කරන ඕනෑම ක්‍රියාවක් ලෙස හඳුනාගත හැකිය. අපරාධ හා මිනිසා අතර ඇති අවියෝජනීය සම්බන්ධය එක් එක් පරිණාමීය යුගයන්හිදී ප්‍රකට වී ඇත. සමාජය පිළිබඳවත් සමාජ සත්ත්වයෙකු වන මිනිසා පිළිබඳවත් අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාව මත බිහිවූ සමාජීය විද්‍යාවන් අතර අපරාධ විද්‍යාවට ප්‍රමුඛ ස්ථානයක් හිමි වන්නේ එබැවිනි.

සිංහල ගැමි සමාජයෙහි පැවැති අපරාධ චර්යාවන්හි ස්වරූපය ජන කවි ඇසුරින් විමර්ශනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අභිප්‍රාය යි. මේ සම්බන්ධයෙන් විද්වත් අවධානය ද යොමු වී ඇති බවක් නො පෙනේ. තෝරා ගත් ජන කවි උපයෝගී කොට ගෙන මෙම අධ්‍යයනය සිදු කෙරිණි. එහි දී ඊට අදාළ ලිඛිත මූලාශ්‍රය පමණක් යොදා ගනු ලැබූ අතර ක්ෂේත්‍ර පර්යේෂණ සිදු නො කෙරිණි.

අපරාධ ක්‍රියා ලෙස සැලකෙන, මිනීමැරුම්, මත් ද්‍රව්‍ය භාවිතය, අවිආයුධ භාවිතය, සූදුව, සොරකම මෙන් ම ගෘහස්ත ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු ජන කවියේ අන්තර්ගත ව ඇති බව මෙම අධ්‍යයනයේ දී හෙළිදරව් විණි. අපරාධ පාලනය හා නිවාරණයට අදාළ යෝජනා ද මෙහි දී හඳුනා ගැනුණි.

**ප්‍රමුඛ පද:** ජන කවිය, අපරාධ චර්යාව, ගෘහස්ත ප්‍රචණ්ඩත්වය, අපරාධ පාලනය හා නිවාරණය

**Keywords:** Folk Song, Criminal Behaviour, Domestic Violence, Crime Control and Prevention

---

1. දිනපතා ලංකාදීප, විජය පුවත්පත් සමාගම; rajithmadu87@gmail.com

2. සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය; ranaweeranishani@gmail.com